# 19 සහජීවනයෙන් ගොඩනැගෙමු

**කොරින්ති හා එපීසවරුන්ට යවන ලද හසුන්වල සඳහන් ව ඇති එකී දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සහජීවනයෙන් යුතු සමාජයක් ගොඩනැගීමට දායක වීම පිළිබඳ ව විමසා බැලීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**එපීස 4:11, 12, 16, 2 කොරින්ති 6:4-7, 16, 7:1**

දෙවියන් වහන්සේ කිතුනුවන් ලෙස අප කැඳවා ඇත්තේ, මේ ලෝකයේ ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් කාර්යභාරයන් ඉටු කිරීමට යි. ඒ සඳහා උන්වහන්සේ අපට පෙන්වා දී ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේ ගමන් කළ දුෂ්කර මාර්ගය මෙන් අපගේ ජීවිත මාර්ග ද දුෂ්කර විය හැකි බවයි. මෙම දුෂ්කර මාර්ගයේ ගමන් කරන විට අප දරන ආකල්ප හා අදහස් සමාජයේ ආකල්ප හා අදහස් සමග නොගැළපෙන අවස්ථා ඇතිවිය හැකිය.

**එසේ නොව, දුක් පීඩා අගහිඟකම් ද විපත්ති ද**
**මහත් ඉවසීමකින් විඳ දරා**
**අපි දෙවියන් වහන්සේගේ සේවකයන් වශයෙන් ඔබට ඒත්තු ගන්වමු.**
**අපි බොහෝ දේ විඳ දරා ගත්තෙමු.**
**පහර ලැබුවෙමු. සිරගත වීමු.**
**අඬන්තේට්ටම් කරනු ලැබුවෙමු.**
**විවේකයක්වත් නින්දක්වත් කෑමක්වත් නැතිව සිටියෙමු.**
**2 කොරින්ති 6:4-5**

අප එකිනෙකාට විවිධ දීමනා ලැබී ඇත. (එපීස 4:11) මෙම දීමනා සභාව තුළ විවිධ සේවාවන් ලෙස හඳුනා ගන්නට පුළුවන. තව ද දේව රාජ්‍යයේ ගුණාංග ක්‍රියාත්මක කරන කිතුනු ප්‍රජාවක් සභාවක් ලෙසට අප, සමාජය සමග සම්බන්ධ වී සිටිමු. මෙහි දී අප තේරුම් ගත යුතු කරුණක් වන්නේ දෙවියන් වහන්සේ අපට දීමනා ලබා දී ඇත්තේ අපගේ පටු අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා නො වන බව යි. එහෙත් ඒවා ලැබී ඇත්තේ ක්‍රිස්තු ශරීරයට බද්ධ ව දේව අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා බව පැහැදිලි යි. ඒ තුළින් අපි ක්‍රිස්තු ශරීරය වර්ධනය කරමු. (එපීස 4:16)

**සහජීවනයෙන් දිවි ගෙවීමේ දී අප මුහුණ දෙන අභියෝග**

**කියවා බලමු.**

**2 කොරින්ති 6:16, 7:1**

අප ජීවත්වන සමාජයීය ප්‍රජාව සම්පූර්ණයෙන් ම කිතුනුවන් සිටින පරිසරයක් නොවන බව තේරුම් ගැනීම වැදගත් ය. එවැනි පරිසරයක දී කිතුනුවන් වන අප සැමවිට ම කල්පනාකාරී ව ජීවත් විය යුතු වේ. අපගේ ක්‍රියාකලාප අන් අය ප්‍රතික්ෂේප කරන, හෙළා දකින සහ ඔවුන්ගේ මත වලට ගරු නොකරන පරිසරයක් නිර්මාණය කර ගැනීමෙන් අප වැළකිය යුතු වේ. මිශ්‍ර සමාජයක රටාව පහත පරිදි අපට හඳුනාගත හැකි ය.

- ❖ මිශ්‍ර විවාහ තුළින් බිහි වන පවුල් ඒකක.
- ❖ සමාජයීය කටයුතුවල දී කිතුනු හා කිතුනු නොවන අයට එක් වී කටයුතු කිරීමට සිදුවීම.

  (මරණාධාර සමිති, සුභසාධක සමිති, සමථ මණ්ඩල)
- ❖ සමාජයීය අසාධාරණකම්වල දී එකතුවී ක්‍රියා කරන සංවිධානවලට ඇතුළත් වීම.

  (රැකියා ස්ථාන)
- ❖ අන්‍ය ආගමික හමුවීම්වල දී සහභාගී වන්නට හා උදව් කිරීමට සිදු වීම.

  (උදාඃ මංගල්‍ය, අවමංගල්‍ය අවස්ථාවන්)
- ❖ වෙනත් ආගමිකයන්ගෙන් ලබන විශේෂ ආරාධනා අවස්ථාවන්

  (සංස්කෘතිකමය හා ආගමික උත්සව)

ඒ සමග ම පාවුල්තුමා ඉදිරිපත් කරන මේ අදහස් කිහිපයට ද දැන් අපි යොමු වෙමු.

- ❖ සිත කය කෙලෙසන සියලු දෙයින් වැළකී සිටින්න. (2 කොරින්ති 7:1)
- ❖ දේව ගරුබිය ඇතිව ශුද්ධවන්තකමින් පරිපූර්ණ වන්න. (2 කොරින්ති 7:1)
- ❖ අපි ජීවමාන දෙවියන්වහන්සේගේ මන්දිර වෙමු. (2 කොරින්ති 6:16)

පාවුල්තුමා ඉදිරිපත් කරන මෙම කාරණා සලකා බැලීමේ දී,

බහු ආගමික, බහු වාර්ගික මිශ්‍ර ප්‍රජාවක් තුළ ජීවත් වීමේ දී සෑම දෙයකට ම එකඟ වීමක් තිබිය නොහැකි ය.

සියලු විශ්වාසවල පවා සමානත්වයක් තිබිය නො හැකි ය.

අප විශ්වාස කරන දෙය අන් අය නො පිළිගන්නා තත්ත්වයන් ද තිබිය හැකි ය.

අප ලබන ආධ්‍යාත්මික දැනුම ක්‍රියාකාරීත්වයට පත්කළ විට සමහර අවස්ථාවන්වල දී අපගේ අදහස්වල නොගැළපීමක් ද ඇතිවිය හැකි ය.

මෙවැනි තත්ත්වයක දී අපගේ ඇදහිල්ල ආරක්ෂා කර ගනිමින් ක්‍රියා කිරීමට වගකීමක් අපට තිබේ. දේව රාජ්‍යයේ ගුණාංග, වටිනාකම් අපගේ ජීවිතවලින් සමාජය තුළ ඉස්මතු කිරීමේ වගකීම ද අපට තිබේ. එවන් කාර්යයක නියැලීම සෑම විට ම කටුක අත්දැකීම්වලට ලක්වන මාවතක් විය හැකි ය. එසේ වුවත් සහජීවන වටිනාකම් ගැන සිතා සමාජයට අපෙන් විය යුතු සේවය නොපිරිහෙලා ඉටු කිරීමට අප උනන්දු විය යුතු ය.

නිදසුනක් ලෙස සමාජය, ළමා ලෝකය සම්බන්ධ ව වගකීමෙන් කටයුතු නො කරන කල එම වගකීම ශුද්ධවර තෙරේසා මව්තුමිය සියතට ගත්තා ය. දේව රාජ්‍යයේ උතුම් ගුණාංගයක් වන දේව ප්‍රේමය සියලු ආගමික හා වාර්ගික සීමාවන් අබිබවමින් සමාජය තුළ ගොඩනැංවීමට ඇය සමත් විය. එවන් සහජීවන ක්‍රියාවලියකට ඇතුළු වෙමින් ඇය දුන් උතුම් ආදර්ශයට අනුව දිවි ගෙවීමට අපි දු වෙහෙසෙමු.

මෙවන් ගුණාංග සහිත ව එකිනෙකා පිළිගනිමින් සමාජයේ යහපත් සම්බන්ධතාවන් වර්ධනය කිරීමට අපි ක්‍රියාකාරී වෙමු.

**ක්‍රියාකාරකම**

1. ඔබට ලැබී ඇති දීමනා 3 ක් හඳුනාගෙන ඒවා දේව ගෞරවය උදෙසා ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි පහදන්න.

2. "සහජීවනයෙන් කටයුතු කරමු" යන මාතෘකාව යටතේ කිතුනු සඟරාවකට ලිපියක් ලියන්න.